**වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වැලිවිටිය-දිවිතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම් තැබීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර මුදල රු.4,954 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ) සේවකයන් දෙදෙනෙකුගෙන් අයකර ගෙන තිබුණු රු.3,600 ක් වූ ඇප මුදල් සේවක ඇප ආයෝජන ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2013 වර්ෂයට පෙර සිට පැවත එන රු.526,365 ක් වූ ලැබිය යුතු මුද්දර ගාස්තු ද, සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.6,657,825 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ සහ රු.10,516,018 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

2006 අප්‍රේල් 15 දිනට පෙර ඉටු කර තිබුණු රු.84,643 ක් වූ කර්මාන්ත 03 ක් සහ කරන්දෙණිය ප්‍රාදේශීය සභාවෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබුණු රු.85,248 ක මුදලට අදාළ කිසිදු ලිපිගොනුවක් හෝ වෙනත් කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

තැන්පත් ගිණුමේ දක්වා ඇති එකතුව රු.528,301 ක් වූ තැන්පතු 97 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 570 සහ 571 නියමයන් අනුව කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.2,487,077 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.361,468 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,125,609 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ සභාවේ ආදායම් ආධාර, ස්වයං උත්පාදන ආදායම සහ පුනරාවර්තන වියදම පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | මුළු පුනරාවර්තන ආදායම් | ආදායම් ආධාර | ස්වයං උත්පාදන ආදායම් | මුළු පුනරාවර්තන වියදම් | ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා ගිය පුනරාවර්තන වියදම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 24,432,250 | 17,469,972 | 6,962,278 | 21,945,173 | 14,982,895 |
| 2014 | 20,892,000 | 13,634,535 | 7,257,465 | 20,530,531 | 13,273,066 |
| 2013 | 14,401,899 | 8,931,318 | 5,470,581 | 13,250,948 | 7,780,367 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂ දෙකෙහි මෙන්ම, සමාලෝචිත වර්ෂයේදී ද ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණය ඉක්මවා පුනරාවර්තන වියදම් වල වැඩිවීමක් පැවතුණි.

(ii) සභාවට ලැබෙන ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් නොහැකි බව පෙන්නුම් කළද, වියදම් අවම කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂයට අදාළව ඇස්තමේන්තු කර තිබුණු රු.26,829,400 ක මුළු පුනරාවර්තන ආදායමින් රු.20,892,000 ක් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 78 ක් පමණ විය.

**2.3.2 වරිපනම් හා බදු**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ වලට අදාළව අයකර ගතයුතුව තිබුණු රු.471,220 ක් වූ වරිපනම් හා බදු මුදලින් වර්ෂය තුළ සියයට 66 ක් අය කරගෙන තිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) ඡේදය පරිදි හිඟ මුදල් අයකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**2.3.3 සේවා සඳහා ගාස්තු**

ඉකුත් වර්ෂ සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.10,678,121 ක් අයකර ගතයුතුව තිබුණ ද, වර්ෂය තුළ අය කරගෙන තිබුණේ රු.4,261,603 ක් හෙවත් සියයට 40 ක් පමණි. මෙ හේතුව නිසා වර්ෂය අවසානයට හිඟ මුදල රු.6,416,518 ක් දක්වා වර්ධනය වී තිබුණු නමුත්, හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.57,250 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.6,416,518 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

**2.3.5 අක්කර බදු**

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි අක්කර බදු ශේෂය රු.159,426 ක් වූ අතර, සභා බලප්‍රදේශයේ සමීක්ෂණයක් පවත්වා අක්කර බදු ආදායම නිසි පරිදි හඳුනාගෙන ඒවා අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරු වල පුරප්පාඩු 07 පැවැතුණු අතර, අතිරික්ත සේවක සංඛ්‍යාව 03 ක් විය. කෙසේ වුවද, පුරප්පාඩු පුරවා ගැනීමට හෝ අතිරික්ත සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

බාහිර පාර්ශවයන්ට අයත් ඉඩම් 10 ක අයිතිය සභාවට පවරා නොගෙන රු.1,425,000 ක වියදම් දරා ගොඩනැගිලි ඉදිකර තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---

ඉකුත් වර්ෂයේ ඉදිකළ ව්‍යාපෘති 07 ක් සඳහා ගෙවිය යුතු එකතුව රු.5,404,815 ක මුදලක් සහ සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති 09 ක් වෙනුවෙන් එකතුව රු.4,694,873 ක මුදලක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.4 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන මත වාඩුවැලිවිටිය දකුණ, පුරාණ ගංගාරාම විහාරස්ථානයේ දහම් පාසල සහ පෙර පාසල සඳහා වැසිකිලියක් ඉදිකිරීමට රු.25,000 ක් අනුමත වී තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම ව්‍යාපෘතිය ඉටු නොකර, එම මුදල පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අනුමත වී තිබුණු එකතුව රු.1,350,000 ක් වූ ව්‍යාපෘති 02 ක කටයුතු දෙසැම්බර් 31 දින වනවිටත් අවසන් කර නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---

### 4.1 අයවැය පාලනය

---

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 02 ක එකතුව රු.64,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයද, තවත් වියදම් විෂයයක සීමාව ඉක්මවා රු.44,281 ක වියදම්ද, ආදායම් විෂයයන් 05 ක ලඟාකර නොගත් ඉලක්කගත ආදායම් රු.3,638,761 ක්ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(ආ) සභාව විසින් වාර්ෂික අයවැය ලේඛනය මඟින් එක් එක් අරමුණු සඳහා සලසා ඇති ප්‍රතිපාදන සත්‍ය වශයෙන් එම අරමුණු සඳහා යෙදවීමේ පසුගාමී තත්ත්වයක් පෙන්නුම්

කෙරෙන බැවින්, එය සභාවට මෙන්ම සභා බලප්‍රදේශයේ ජනතාවට සිදු වූ පාඩුවක් බව විගණනයේ දී නිරීක්ෂණය විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

------------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ 2014 පෙබරවාරි 24 දිනැති අංක: දපපා/යහ/01/න.ව.ලේ. දරන පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

--------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

පිරිවැය රු.650,000 ක් වූ ලෑන්ඩ් කෲසර් වාහනය සහ පිරිවැය රු.10,000 ක් වූ ඡායා පිටපත් යන්ත්‍රය සම්බන්ධයෙන් 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**(ආ) පවරා නොගත් වත්කම්**

-------------------------

(i) පරිත්‍යාගයක් ලෙස ප්‍රාදේශීය සභාවට ලැබී තිබූ ඉඩමේ ප්‍රාදේශීය ලේකම් විසින් රු.980,000 ක් වියදමින් ළමා හා මාතෘ සායන ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. අදාළ ගොඩනැගිලි සැලැසුමට ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර, එම ගොඩනැගිල්ල ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) සභාව විසින් භාවිතයට යොදා ගන්නා වාහන 03 ක අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) වාහන පාලනය